අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/05/02/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.12.07

චක්‍රලේඛ අංක :- 45/2023

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්

**අ.පො.ස.(උ.පෙළ) විෂය ධාරා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් පිරිනැමෙන ශිෂ්‍යත්ව වැඩසටහන 2022 (2023)**

2022 (2023) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට එම විභාගය සමත්ව අ.පො.ස (උසස් පෙළ) හැදෑරීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් මෙම වර්ෂයේදීද ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන දිවයිනේ සියලුම අධ්‍යාපන කලාපවල ක්‍රියාත්මක කිරීමට නියමිත අතර මේ යටතේ එක් කලාපයකට පිරිනැමෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 50 ක් වේ. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින තෙක් මසකට රු.6,000/- බැගින් මාස 24 ක උපරිම කාල සීමාවක් සඳහා එම ශිෂ්‍යත්ව මුදල ලබා දෙනු ලැබේ.

**1 ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

1.1 **2022(2023) වර්ෂයේදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට,** විභාගය සමත්ව උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලබා තිබීම.

1.2 රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වීම.

1.3 ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවීම.

**2 අයදුම්පත් ඉදිරිපත් කිරීම.**

2.1 සෑම පාසලකම විදුහල්පතිවරුන් විසින් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව 2022(2023) වර්ෂයේදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත් තම පාසලේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුම්වත් කළ යුතුය.

2.2 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය **(ඇමුණුම 01)** හා ඊට අදාළ උපදෙස් පාසලේ දැන්වීම් පුවරුවෙහි පළ කිරීමට විදුහල්පතිවරුන් විසින් වගබලා ගත යුතුය.

2.3 මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු සහ අයදුම්පත්‍රය ජනාධිපති කාර්යාලයේ www.presidentsoffice.gov.lk , ජනාධිපති අරමුදලේ www.presidentsfund.gov.lk , ජනාධිපති මාධ්‍ය අංශයේ www.pmd.gov.lk සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk යන වෙබ් අඩවිවල පළ කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 ඉහත අංක 1 හි මූලික සුදුසුකම් සපුරා ඇති හා ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට කැමති ශිෂ්‍ය ශිෂ්‍යාවන් අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය **(ඇමුණුම 01)** අනුව සකස් කර ගත් අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සහිතව **අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ පාසලේ විදුහල්පති වෙත පමණක් නියමිත දිනයට හෝ ඊට පෙර භාරදීමට කටයුතු කළ යුතුය.**

2.5 ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම පිළිබඳව ග්‍රාම නිලධාරි සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ද සහිතව සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ යුතුය.(ආදායම් වාර්තා ලබා ගැනීම අවශ්‍ය නැත.)

2.6 නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති සහ අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 3 තෝරා ගැනීමේ ක්‍රමවේදය

### 3.1 පාසල් මට්ටම

3.1.1 මෙම චක්‍රලේඛයේ 04 හි දැක්වෙන නිර්ණායක හා ලකුණු පටිපාටිය පදනම්ව පාසල් තේරීම් කමිටුවක් මඟින් පාසලට ලැබෙන අයදුම්පත්වල ලකුණු පරීක්ෂා කළ යුතුය. පාසල් තේරීම් කමිටුව සඳහා විදුහල්පති හෝ නම් කරනු ලබන නියෝජ්‍ය/සහකාර විදුහල්පතිගේ සභාපතිත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ ගුරුවරු දෙදෙනෙකු පත් කර ගත හැකි අතර, අයදුම්පත් සංඛ්‍යාව අනුව තේරීම් කමිටු එකකට වඩා පත් කර ගත හැකිය.

3.1.2 සිසුන් විසින් නියමිත දිනට ලබාදෙන ලද අයදුම්පත් හා පාසලේ විදුහල්පති හෝ නියෝජ්‍ය/සහකාර විදුහල්පති විසින් සහතික කරන ලද සහතික පත්වල ඡායාපිටපත් සමඟ අදාළ **ශිෂ්‍ය ශිෂ්‍යාවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ පාසල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර යොමු කළ යුතුය.**

### 3.2 කලාප මට්ටම

3.2.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය. අදාළ කලාපයට ලැබී ඇති අයදුම්පත් අනුව කලාපයට **නියමිත ශිෂ්‍යත්ව සංඛ්‍යාව 50 ක් වන සේ තේරීම් කමිටු මඟින් ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සිදු කළ යුතුය.**

3.2.2 ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගේ සභාපතිත්වය යටතේ තවත් මාණ්ඩලික නිලධාරියෙකු හා ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු සහිතව තිදෙනෙකුගෙන් සමන්විත කලාප මට්ටමේ තේරීම් කමිටුවක් පත් කර ගත යුතුය.

3.2.3 ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව සැළකිය යුතු සංඛ්‍යාවක් ඉක්මවා ඇති අවස්ථාවකදී තේරීම් කමිටු එකකට වඩා පිහිටුවා ගත හැකිය.

3.2.4 **තේරීම් කමිටු මඟින් ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීමට අදාළ ව මෙම චක්‍රලේඛයේ 04 හි දැක්වෙන නිර්ණායක හා ලකුණු ක්‍රමය පදනම් කර ගත යුතු වේ.**

3.2.5
- ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු, **ලබාගත් ලකුණු අනුපිළිවෙල මත ආකෘති 01 හි දක්වා ඇති පරිදි ශිෂ්‍ය නාම ලේඛනය සකස් කළ යුතුය.**
- **ඊට සමගාමීව තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම් විස්තර සහිත ලේඛනයද (ආකෘති 02 අනුව) සකස් කිරීම කළ යුතුය. (මේ සමඟ තේරිපත්වූ ශිෂ්‍යත්වලාභීන්ගේ නමට පවතින සක්‍රිය බැංකු ගිණුමක ඡායා පිටපත සහ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්ද ලබා ගෙන අකෘති 02 සමඟ ඉදිරිපත් කළ යුතුය.)**

**(අදාළ සෑම අකෘතියකම ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන අනුපිළිවෙල නොවෙනස්ව සඳහන් කිරීමට කටයුතු කළ යුතු අතර, ජා.හැ.ප. සහ බැංකු ගිණුම්වල සඳහන් නම අයදුම්පතේ සඳහන් කර ඇති නම හා සමාන විය යුතුය.)**

3.2.6 තේරීපත් නොවූ අනෙකුත් අයදුම්කරුවන්ගේ ද වෙනම ලැයිස්තුවක් (ලබාගත් ලකුණු ප්‍රමාණය අනුපිළිවෙල අනුව) සකස් කර කලාප කාර්යාලයේ ගොනු කර තබාගත යුතුය.

3.2.7 තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර මෘදු හා දෘඪ පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. **කලාප සම්බන්ධීකරණ නිලධාරීන් විසින් තෝරා ගත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතික පත්වල පිටපත් ගොනු කර තබා ගත යුතුය.**

## 3.3 පළාත් මට්ටම

3.3.1 පළාත් මට්ටමේදී මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

3.3.2 කලාප මට්ටමින් යොමු කරන ලේඛනවලට අනුව එක් කලාපයකට ශිෂ්‍යත්ව 50 ක් වන සේ පළාත් මට්ටමේ සමස්ථ ලේඛනය සකස් කළ යුතු අතර, ලේඛන ගත කර ඉදිරිපත් කිරීමේදී **කලාපයකට නියමිත උපරිම ශිෂ්‍යත්ව ගණන කිසිසේත් ඉක්මවීමට කටයුතු නොකළ යුතුය.**

3.3.3 පළාත් මට්ටමින් තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය (අකෘති 01) හා බැංකු ගිණුම් විස්තර ඇතුළත් ලේඛන (ආකෘති 02) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතු වේ.

3.3.4 අදාළ නාම ලේඛනවල මෘදු පිටපත් ජනාධිපති අරමුදලේ pfschol@presidentsoffice.lk සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ directorschoolactivities@yahoo.com යන විද්‍යුත් ලිපිනයන් වෙත නියමිත දිනයේදී එවීමට කටයුතු කළ යුතුය.

## 3.4 ජාතික මට්ටම

3.4.1 **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ** නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය (ආකෘති 01) හා බැංකු ගිණුම් විස්තර ඇතුළත් ලේඛන (ආකෘති 02) නියමිත කාල සීමාවේදී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේද නිර්දේශ සහිතව ලේකම්, ජනාධිපති අරමුදල වෙත යොමු කළ යුතුය.

3.4.2 එලෙස යොමු කරනු ලබන යෝජිත ශිෂ්‍යත්වලාභීන් සඳහා පමණක් මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.

# 4 නිර්ණායක හා ලකුණු පටිපාටිය

අයදුම්කරුවෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

## 4.1 <u>පවුල සම්බන්ධ තොරතුරු ( අයදුම්පතේ අංක 01)</u>

| | | |
|---|---|---|
| 4.1.1 | පවුලේ වයස 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිවීම | - ලකුණු 04 |
| 4.1.2 | දෙමව්පියන් දෙදෙනාම අහිමි වීම | - ලකුණු 06 |
| 4.1.3 | දෙමව්පියන් නොමැති භාරකරුවෙකු ළඟ සිටීම<br>**(එසේ නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ වන ලේඛනවල පිටපත් ඇමිණිය යුතුය.)** | - ලකුණු 03 |
| 4.1.4 | දෙමව්පියන්ගෙන් එක් අයෙක් අහිමිවීම | - ලකුණු 02 |
| 4.1.5 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවයකදී<br>(අර්ධ දුබලතාවයක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න) | - ලකුණු 10 |

(උපරිම ලකුණු 25)

සැ.යු. :- දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවයන් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.

**4.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල (අයදුම්පතේ අංක 02)**

4.2.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂයයන් සඳහා

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - ලකුණු 02 |

4.2.2 **කාණ්ඩ විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණු 01 බැගින් විෂයයන් 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.**

(උපරිම ලකුණු 50)

**ක්‍රීඩා (අයදුම්පතේ අංක 03)**

**4.3**

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි / රගර්/ හොකී/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාටේ/ මේස පන්දු හෝ වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**4.4 සෞන්දර්යය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් (අයදුම්පතේ අංක 04)**

- ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/කථික/නිවේදන/දැනුම මිනුම/ චිත්‍ර/නැටුම්/වාදනය/ගායනය/වේදිකා නාට්‍ය/විෂය ප්‍රවීනතා ජයග්‍රහණ/ ශිෂ්‍යභට /බාලදක්ෂ /ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**4.5 ශිෂ්‍ය නායකත්වය (අයදුම්පතේ අංක 05)**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | - ලකුණු 05 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) | - ලකුණු 04 |
| පන්ති නායක | - ලකුණු 02 |

(උපරිම ලකුණු 05)

**සැ.යු. :-**

- **ඉහත 4.3 සහ 4.4 හිදී, එක් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.**
- **ඉහත 4.5 හිදී ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.**

## 5 ශිෂ්‍යත්ව ප්‍රදානය

5.1 ද්විතියික අධ්‍යාපනය සඳහා අදාළ වර්ෂයේ 12 වන ශ්‍රේණියට ඇතුළත්ව අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය ආරම්භ කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතුරින් තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින තෙක් අවුරුදු 02 ක කාල සීමාව තුළ එක් මසකට රු.6,000/- බැගින් ශිෂ්‍යත්ව වාරික 24 ක් ලබා දෙනු ලැබේ. ශිෂ්‍යත්වලාභින් තෝරාගත් පසුව අදාළ මුදල ශිෂ්‍යත්වලාභින්ගේ නමට පවතින බැංකු ගිණුමකට පමණක් සෘජුවම බැර කරනු ලැබේ.

5.2 අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත්ව වෙනත් පාසලකට ඇතුළත් වූයේ නම්, ඒ බව තහවුරු කරන ලිපියක් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ලබාදිය යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිතව ජනාධිපති අරමුදල වෙත ඒ බව දැනුම්වත් කිරීම කඩිනමින් කළ යුතුය.

අදාළ ශිෂ්‍යත්වලාභියා විසින් ද තමන් පාසල හැරගිය බවත්, අළුතින් ඇතුලත් වූ පාසලේ නම සහිතව ලිපියක් වර්තමානයේ අධ්‍යාපනය ලබන පාසලේ විදුහල්පති මඟින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම්වත් කළ යුතුය.

## 6 ශිෂ්‍යත්ව නියාමනය

6.1 කලාප මට්ටමින් ශිෂ්‍යත්ව නියාමනය කිරීම ඔවුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය. ඒ සඳහා සම්බන්ධිකරණ නිලධාරියාට අදාළ වගකීම පැවරිය යුතුය.

6.2 පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධ වගකීම සම්බන්ධිකරණ නිලධාරියාට පැවරිය යුතුය.

6.3 ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය හා ජනාධිපති අරමුදල මඟින් සිදු කරනු ඇත.

## 7 ශිෂ්‍යත්ව අවලංගු කිරීම.

7.1 පහත සඳහන් හේතූන් මත මෙම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය ජනාධිපති අරමුදල සතුවේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීම සඳහා දඬුවම් ලැබීම.
II. අඛණ්ඩව පාසලට නොපැමිණීම.
III. අඛණ්ඩව අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
IV. අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.
V. ගාස්තු ගෙවනු ලබන /ජාත්‍යන්තර පාසලකට ඇතුළත් වීම.

## 8 කාල රාමුව

| | කාර්යය | කාලය (අදාළ කාර්යය කළ යුතු අවසන් දිනය) |
|---|---|---|
| 8.1 | අයදුම්පත් කැඳවීම සහ භාර දීම | 2023.12.22 දින හෝ ඊට පෙර |
| 8.2 | විදුහල්පති විසින් කලාප අධ්‍යාපන කාර්යාලයට අයදුම්පත් යැවීම. | 2024.01.08 දින හෝ ඊට පෙර |
| 8.3 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා ශිෂ්‍යත්වලාභින් තෝරා ගැනීම හා අදාළ ලේඛන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යැවීම. | 2024.01.29 දින හෝ ඊට පෙර |
| 8.4 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ ලේඛන පරීක්ෂා කර බලා අවසන් නාම ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීම. | 2024.02.06 දින හෝ ඊට පෙර |
| 8.5 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් එම ලේඛන ජනාධිපති අරමුදල වෙත යොමු කිරීම. | 2024.02.12 දින හෝ ඊට පෙර |

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් ඇත්නම් ඒ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එන්. රණසිංහ

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :- 01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය } කාරුණික දැන ගැනීම සඳහා
02. ලේකම්, ජනාධිපති අරමුදල

**ජනාධිපති අරමුදල**

## උපදෙස් පත්‍රිකාව

## අ.පො.ස.(උ.පෙළ) හැදෑරීමට ජනාධිපති අරමුදල මඟින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීම

### සුදුසුකම්

- අයදුම්කරුගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවිය යුතුය.
- රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක විය යුතුය.
- 2022(2023) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට, 2025 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ලැබ සිටිය යුතුය.

### අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම

- අයදුම්පත්‍රයේ අංක 01 සිට 06 දක්වා කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.
- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුලත් කල යුතුය.
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම් ඔවුන්ගේ එකඟතාවය සහිතව පවුලේ ලඟම ඥාතියෙකුගේ / පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් හෝ ලබා දීමට කටයුතු කල යුතුය.
- අදාළ ප්‍රශ්න සඳහා ලකුණු ලබා දීමද අයදුම්කරු විසින් ම සිදු කල යුතු අතර අදාල ප්‍රතිඵල සත්‍යය බවට විදුහල්පති විසින් සහතික කල යුතුය.
- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත ඔබ අ.පො.ස.(සා.පෙළ) හදාරන ලද පාසලේ විදුහල්පති වෙත පමණක් භාර දිය යුතුය.**
- විදුහල්පති විසින් පමණක් අදාළ අයදුම්පත්‍ර ලැයිස්තු ගතකොට පාසල අයත් කලාප කාර්යාලය වෙත භාර දිය යුතුය.
- කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතුය.

### 01. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

01.01. පවුලේ වයස 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිවීම - ලකුණු 04
01.02. දෙමව්පියන් දෙදෙනාම අහිමි වීම - ලකුණු 06
01.03. දෙමව්පියන් නොමැතිව භාරකරුවෙකු ලඟ සිටීම - ලකුණු 03
01.04. දෙමව්පියන්ගෙන් එක් අයෙක් අහිමිවීම - ලකුණු 02
01.05. ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවයකදී - ලකුණු 10
(අර්ධ දුබලතාවයක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න)

(උපරිම ලකුණු 25 )

සැ.යු. :- දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවයන් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.

**02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂයන් සඳහා**

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - ලකුණු 02 |

කාණ්ඩ විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණු 01 බැගින් විෂයයන් 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.

(උපරිම ලකුණු 50)

**03. ක්‍රීඩා**

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි / රගර්/ හොකී/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ මේස පන්දු හෝ වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**04. සෞන්දර්යය හා විෂය සමගාමී ක්‍රියාකාරකම්**

ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/කථික/නිවේදන/දැනුම මිනුම/ චිත්‍ර / නැටුම්/ වාදනය/ ගායනය/වේදිකා නාට්‍ය/විෂය ප්‍රවීනතා ජයග්‍රහණ / ශිෂ්‍යභට /බාලදක්ෂ / ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**05. ශිෂ්‍ය නායකත්වය**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | - ලකුණු 05 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) | - ලකුණු 04 |
| පන්ති නායක | - ලකුණු 02 |

(උපරිම ලකුණු 05)

සැ.යු. :-

• ඉහත 03 සහ 04 හිදි, එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.

• ඉහත 05 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.

**ජනාධිපති අරමුදල**

ඇමුණුම 01

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :-

**2022 (2023) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට විභාගය සමත්ව 2025 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව - අයදුම්පත්‍රය**

(කරුණාකර අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර <u>උපදෙස් පත්‍රිකාව</u> බලන්න.)

පළාත :- .............................. දිස්ත්‍රික්කය:- ......................... අධ්‍යාපන කලාපය :- ..............................

## I කොටස - අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු

මුලකුරු සමග නම (සිංහල) :- ..............................................................................................

මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහල) :- ..............................................................................................

මුලකුරු සමග නම (ඉංග්‍රීසි) :- ..............................................................................................

අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි මාධ්‍යය :- (සිංහල/දමිළ/ඉංග්‍රීසි)

විභාග අංකය :- ..............................................................................................

2022 (2023) වර්ෂයේ විභාගයට පෙනී සිටියේ පළමු වරටද? :- (ඔව්/නැත)

අ.පො.ස.(සා.පෙළ) විභාගය පෙනී සිටි පාසල :- ..............................................................................................

අ.පො.ස.(උ.පෙළ) හැදෑරීමට අපේක්ෂිත පාසල :- ..............................................................................................

උපන් දිනය :- ☐☐☐☐ ☐☐ ☐☐ (YYYY –MM –DD)

ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

දුරකථන අංකය (කෙටි පණිවුඩ යැවිය හැකි) :- 0 7 ☐☐☐☐☐☐☐☐

දුරකථන අංකය (සම්බන්ධ කර ගත හැකි) :- ☐☐☐☐☐☐☐☐☐☐

පෞද්ගලික ලිපිනය (සිංහල) :- ..............................................................................................
..............................................................................................

පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි) :- ..............................................................................................
..............................................................................................

---

## II කොටස 01. පවුල සම්බන්ධ තොරතුරු

| | | | ලකුණු |
|---|---|---|---|
| 01.01 | දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව (...........) | :- | |
| 01.02 | ඔබගේ මව්පිය දෙදෙනාම ජීවත්ව සිටින්නේද? ඔව්/නැත | :- | |
| 01.03 | දෙමව්පියන් නොවන භාරකරුවකු යටතේ සිටින්නේද? ඔව්/නැත<br>(එසේ නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ වන ලේඛනවල පිටපත් ඇමිණිය යුතුය.) | | |
| 01.04 | ඔබගේ මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් අයෙක් පමණක් ජීවත්ව සිටින්නේද?<br>.................. පමණක් සිටී. | :- | |
| 01.05 | ඔබ ශාරීරික දුබලතාවයකින් පෙළෙන්නේද? ඔව්/නැත<br>ඒ දුබලතාවය කුමක්ද? .............................................................. | :- | |

ලබාගෙන ඇති ලකුණු එකතුව :- ☐
(උපරිම ලකුණු ප්‍රමාණය 25 කි.)

**ජනාධිපති අරමුදල**

02 **අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල**

| | විෂයය | | ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|
| 02.01 | ආගම | :- | ............... | |
| 02.02 | භාෂාව හා සාහිත්‍යය | :- | ............... | |
| 02.03 | ඉංග්‍රීසි භාෂාව | :- | ............... | |
| 02.04 | ගණිතය | :- | ............... | |
| 02.05 | ඉතිහාසය | :- | ............... | |
| 02.06 | විද්‍යාව | :- | ............... | |
| 02.07 | පළමු විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය.............................................) | :- | ............... | |
| 02.08 | දෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය.............................................) | :- | ............... | |
| 02.09 | තෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය.............................................) | :- | ............... | |

ලබාගෙන ඇති ලකුණු එකතුව
(උපරිම ලකුණු ප්‍රමාණය 50 කි.)

03. **ක්‍රීඩා**

(උදාහරණ:අත්පන්දු / දැල්පන්දු / පාපන්දු / පැසිපන්දු /ක්‍රිකට් / එල්ලේ / බැඩ්මින්ටන්/ කබඩි/ රගර්/ හොකී/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ මේස පන්දු හෝ වෙනත්)

| ක්‍රීඩාව | කලාප මට්ටමින් | | පළාත් මට්ටමින් | | ජාතික මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | |
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

ලබාගෙන ඇති ලකුණු එකතුව
(උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.)

04 **සෞන්දර්යය හෝ විෂය සමගාමී ක්‍රියාකාරකම්**

ජනාධිපති අරමුදල

(උදාහරණ- ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/කථික/නිවේදන/දැනුම මිනුම තරඟ/වාදනය/ගායනය/ චිත්‍ර/නැටුම්/වේදිකා නාට්‍ය/බාලදක්ෂ/ශිෂ්‍යභට/ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්/ විෂය ප්‍රවීනතා ජයග්‍රහණ හෝ වෙනත්)

| ක්‍රියාකාරකම් | කලාප මට්ටමින් | | පළාත් මට්ටමින් | | ජාතික මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | | නායකත්වය/සහභාගිත්වය | |
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

ලබාගෙන ඇති ලකුණු එකතුව
(උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.)

05. **ශිෂ්‍ය නායකත්වය**

| | | ලකුණු |
|---|---|---|
| 01 | පාසල් ප්‍රධාන ශිෂ්‍ය නායක<br>පාසල් උප ප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 02 | ශිෂ්‍ය නායක (කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ) | |
| 03 | පන්ති නායක | |
| | ලබාගෙන ඇති ලකුණු එකතුව<br>(උපරිම ලකුණු ප්‍රමාණය 05 කි.) | |

---

06 **ලකුණු සාරාංශය**

| | | |
|---|---|---|
| 01 | පවුල සම්බන්ධ තොරතුරු | |
| 02 | අ.පො.ස.(සා.පෙළ) විභාගය | |
| 03 | විෂය සමගාමී - (ක්‍රීඩා) | |
| 04 | විෂය සමගාමී - (සෞන්දර්යය හා වෙනත්) | |
| 05 | ශිෂ්‍ය නායකත්වය | |
| | **ලබාගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය** | |

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවකදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට මම එකඟ වෙමි.

........................
අයදුම්කරුගේ අත්සන

දිනය : ........................

**ජනාධිපති අරමුදල**

**<u>පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය</u> :-**

**(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළ යුතුය.)**

මම ........................................................................................................ රැකියාව කරමි./ රැකියාවක් නොකරමි.
(රැකියාව කුමක්ද යන්න)
මගේ ස්වාමිපුරුෂයා/භාර්යාව...................................................................... ආයතනයේ රැකියාව කරනු ලබයි./ රැකියාවක් කරනු නොලබයි. අප පවුලේ මාසික ආදායම රු: .................................. බව ද ප්‍රකාශ කරමි.

..........................................
මව/පියා/භාරකරුගේ අත්සන

දිනය: ......................
නම : .....................................

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

...................................
ග්‍රාම නිලධාරීගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය: .......................

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

...............................
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

දිනය: .....................

---

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,**

ඉහත 1-5 දක්වා සඳහන් කර ඇති ලකුණු ලබාදීම නිවැරදි බවත්, අනෙකුත් පෞද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. එබැවින් .............................................................ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..............................
විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය: ...................

---

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා,**

කලාපීය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ විස්තර

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | ................................................ | ............................. | .......................... |
| 2. | ................................................ | ............................. | .......................... |
| 3. | ................................................ | ............................. | .......................... |

ආකෘති 1

## අ.පො.ස (උ/පෙළ) හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා නිර්දේශිත නාම ලේඛනය (2022 (2023) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත)

(ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය)

පළාත :
දිස්ත්‍රික්කය :
අධ්‍යාපන කලාපය :

| අනුක්‍රමික අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | ජන වර්ගය | අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනිසිටි පාසල | අ.පො.ස. (උ.පෙළ) හැදෑරීමට අපේක්ෂා කරන පාසල | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | |
| 02. | | | | | | | |
| 03. | | | | | | | |
| 04. | | | | | | | |
| . | | | | | | | |
| . | | | | | | | |
| . | | | | | | | |
| 50. | | | | | | | |

| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර | රාජකාරී ලිපිනය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

දිනය :

ඉහත තෝරාගත් සිසු නාම ලේඛණය නිර්දේශ කරමි.

දිනය :- ..................................

අත්සන හා නිලමුද්‍රාව :- ..........................................
(පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ)

**අකෘති 01 සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. :-**

I. **<u>MS - Excel Sheet</u>** එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

II. ශිෂ්‍යාත්වලාභීන්ගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

**උදා- ඒ බී සී සේනානායක** | √ | **ඒ.බී.සී.සේනානායක** | x |

III. ලිපිනය සඳහන් කිරීමේදී නිවැරදිම ලිපිනය සඳහන් කිරීම කළ යුතු වේ.

IV. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සමාජිකයින් අත්සන් කරන ලද ලේඛණය නිර්දේශ කිරීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවීම කළ යුතු අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් එම ලේඛණය නිර්දේශ කර එවීමට කටයුතු කළ යුතුය.

**Forms 02**

## List of names recommended for scholarships to be awarded to GCE (A/L) students by the President's Fund. (Based on their performance at the GCE (O/L) Examination held in 2022 (2023)

**Province:**

**District:**

**Educational Zone:**

Tel. No:

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **Serial No.** | **NIC No** | **Name of the student** | **Bank & Branch** | **Bank code** | **Branch code** | **Account number** | **Mobile Number (SMS)** | **Mobile Number** | **Address** |
| 01<br>02<br>03<br>04<br>05<br>.<br>.<br>.<br>.<br>.<br>50 | | | | | | | | | |

............................

**Signature**

Date: **Zonal Education Director**

**<u>ආකෘති 02 පිරවීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැළකිලිමත් විය යුතුය.</u>**

1. ආකෘති පත්‍රය 02 **<u>ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්</u>** පුරවා එවිය යුතුය.

2. **<u>MS - Excel Sheet</u>** එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

3. **<u>"Times New Roman"</u>** ආකාරයට **<u>අකුරු ප්‍රමාණය 11</u>** න් ඉහත ආකෘති පත්‍ර 02 සම්පූර්ණ කර එවිය යුතුය.

4. ශිෂ්‍යත්වලාභීන්ගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

   උදා- **<u>A B C Senanayake</u>** | √ | **<u>A.B.C.Senanayake</u>** | x |

5. ශිෂ්‍යත්වලාභීන්ගේ දුරකථන අංකය සඳහන් කිරීමේදී සැම විටම පහත පරිදි නිවැරදිව සඳහන් කිරීම කළ යුතුය.

   උදා- 0771111111 - √
   077 1111111 - **x**  077 - 1111111 - **x**

6. සියළුම ශිෂ්‍යාධාරලාභීන් සඳහා ශිෂ්‍යත්ව මුදල් ගෙවීම් කිරීම සඳහා **<u>ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ශිෂ්‍යයත්වලාභියාගේ නමට</u>** පවතින සක්‍රිය ගිණුමක ගිණුම් තොරතුරු පමණක් ලබාදිය යුතු අතර, එලෙස එම බැංකුවල ගිණුමක් නොමැතිනම් නව ගිණුමක් ආරම්භ කර එම ගිණුම් අංකය සඳහන් කර එවිය යුතුය.

7. තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුමේ සහ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ලබාගැනීම කළ යුතු අතර. අදාළ ලේඛණ සමඟ එම ඡායා පිටපත් එවීමට කටයුතු කළ යුතුය.